# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2190/33 - 2020 අගෝස්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2020.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2013.

**(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත**

(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඉඩම් අමාත්‍ය.

2020 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ.

නියෝග

2014 මැයි මස 30 වැනි දින අංක 1864/54 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබ කලින් කල සංශෝධනය කරන ලද 2013 ඉඩම් අත්පත් කරගැනීමේ (වන්දි ගෙවීම්) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ත) අනු ඡේදයේ "මධයම අධිවේගී මාර්ගය." යන්න වෙනුවට "මධ්‍යම අධිවේගී මාර්ගය ;" යන්න ආදේශ කිරීමෙන් ;

(2) මෙහි 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ත) අනු ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනු ඡේද ඇතුළත් කිරීමෙන් ඃ

"(ද) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ;

(න) කඩුවෙල, කෝට්ටේ, තිඹිරිගස්යාය, කොළඹ ප්‍රදේශ හරහා දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය ;

1A - PG 5113 — 22 (2020/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ප) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව පදනම යටතේ පහත සඳහන් ප්‍රදේශ හරහා දිවෙන බස්නාහිර කලාපීය සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය : -

(i) රාගම, කඩවත, කොටුව, කිරුළපන (රක්ත මාර්ගය) ;

(ii) කැළණිය, බොරැල්ල, නුගේගොඩ, පිළියන්දල, මොරටුව (හරිත මාර්ගය) ; සහ

(iii) හුණුපිටිය, අංගොඩ, කොස්වත්ත, කොට්ටාව (නීල මාර්ගය) ;

(බ) දඹුල්ල හරහා කුරුණෑගල සිට හබරණ දක්වා දුම්රිය මාර්ගය.".

09 - 256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.